# අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

# හම්බන්තොට

2021 වර්ෂයට සැපයුම් සේවාවන්, කොන්ත්‍රාත් වැඩ සඳහා

## සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වැඩ, සැපයුම් හා සේවාවන් ලබා ගැනීම පිණිස 2021 වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති පිළිගත් නිෂ්පාදකයින්ගෙන් / දේශීය ඒජන්තවරුන්ගෙන් / සැපයුම්කරුවන්ගෙන් / සේවා සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## වැඩ

අයිතම අංකය විස්තර

01. ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියාව
02. මහා මාර්ග, පාලම්, බෝක්කු ඉදිකිරීම හා අලුත්වැඩියාව.
- ඉහත 01 හා 02 අයිතම සඳහා (CIDA) හෝ පළාත් සභා ලියාපදිංචිය අනිවාර්ය වන අතර ඊට අදාල වලංගු ලියාපදිංචි සහතික වල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතු වේ.

03. වැව් ඇලවේලි හා කෘෂි ළිං ඉදිකිරීම හා අලුත්වැඩියාව
04. සියලුම වෙල්ඩින් වැඩ හා ඇලුමිනියම් වැඩ
05. ගොඩනැගිලි විදුලි පද්ධති වැඩි දියුණු කිරීම හා අලුත්වැඩියාව
06. ජල නල පද්ධති වැඩි දියුණු කිරීම හා අලුත්වැඩියාව

## සැපයුම් (භාණ්ඩ)

ලිපි ද්‍රව්‍ය

07. සියලුම වර්ගවල ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා
08. පරිගණක ලිපි ද්‍රව්‍ය (පරිගණක කඩදාසි, රිබන්, ඩිස්කට් හා වෙනත්)

කාර්යාල උපකරණ

09. සියලුම වර්ගවල කාර්යාලීය උපකරණ,
10. රබර් මුද්‍රා, දින මුද්‍රා, බ්ලොක් සහ මුද්‍රණ කටයුතු
11. පරිගණක යන්ත්‍ර, යතුරුලියන, රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ගණක යන්ත්‍ර, එම අමතර කොටස් සහ ජාලගත කිරීමේ උපාංග
12. ලෝහ, ලී සහ ප්ලාස්ටික් නාම පුවරු

වාහන අමතර කොටස්

13. සියලුම වර්ගවල මෝටර් රථ අමතර කොටස් සහ උපාංග
14. ටයර්, ටියුබ් සහ බැටරි

ගොඩනැගිලි ද්‍රව්‍ය

15. සියලුම වර්ගවල ගොඩනැගිලි ද්‍රව්‍ය(පස්,ගල්,වැලි,)
16. ජලනල සහ ජලාපවාහන උපකරණ
17. සියලුම වර්ගවල විදුලි උපකරණ
18. වායු සමීකරණ යන්ත්‍ර සහ එම අමතර කොටස්

වෙනත් සේවා

19. පරිගණක යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, යතුරුලියන සහ ගණක යන්ත්‍ර වැනි භාණ්ඩ අලුත්වැඩියාව
20. පරිගණක ජාල පද්ධතිය හා CCTV සවිකිරීම අලුත්වැඩියාව සහ නඩත්තු කිරීම
21. කාර්යාල උපකරණ අලුත්වැඩියාව (ලී බඩු අලුත්වැඩියාව පුටු විවීම ඇතුළුව)
22. බදු පදනම මත උත්සව අවස්ථා සඳහා උපකරණ සැපයීම. (මඩු/පුටු/ශබ්ධ විකාශන යන්ත්‍ර/ TV පැනල්/ වේදිකා සහ සැරසිලි)

වාහන

23. සියලුම වර්ගවල වාහන අලුත්වැඩියාව (වාහන වායුසමීකරණය කිරීම, ටින්කරින්, පින්තාරු සහ කුෂන් කිරීම ඇතුළු)
24. වාහන සේවා කිරීම

වෙනත්

25. ශීතකරණ යන්ත්‍ර, වායුසමීකරණ යන්ත්‍ර ඇතුළු විදුල උපකරණ අලුත්වැඩියාව
26. රෙදි සේදීම, පිරිසිදු කිරීම ආදිය (සංචාරක බංගලාව)
27. පවිත්‍රතා සේවා සැපයීම
28. ආරක්ෂක සේවා සැපයීම
29. බීජ හා තවන් කරන ලද පැළ සැපයීම.
30. සූර්ය කෝෂ (sola panel system) පද්ධති සැපයීම හා අලුත් වැඩියා කිරීම.
31. නිල නිවාස සහ සංචාරක නිවාස උපකරණ

32 ක්‍රීඩා භාණ්ඩ සහ සුඛසාධන භාණ්ඩ
පිඟන්, කෝප්ප, හැඳි, ගෑරුප්පු, ඇලුමිනියම් මෙවලම් සහ වීදුරු භාණ්ඩ
33 නිල ඇඳුම්, වැහි කබා, සම්භාණ්ඩ සහ කාර්යාල බෑග්
34 සංගීත උපකරණ
35 ජලය, පිසූ ආහාර හා තේ පැන් ආදිය සැපයීම
36 ආපනශාලා පවත්වාගෙන යාම
37 කළුගල් ආශ්‍රිත සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
38 පානීය ජලය සහ උද්‍යාන පාලනය සඳහා ජලය සැපයීම (බවුසර් මගින් සැපයීම)

## කොන්දේසි සහ වැඩිදුර උපදෙස් :

(1) පහත සඳහන් ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පතක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් හෝ www.hambantota.dist.gov.lk වෙබ් පිටුවෙහි Download වරණයට පිවිසීමෙන් ලබාගන්නා අයදුම්පතක් නිසි පරිදි සම්පූර්ණ කර 2020.12.24 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පළමු මහළ, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම මගින් හෝ අතින් ගෙනවිත් ගිණුම් අංශයේ සැපයුම් නිලධාරී වෙත භාරදිය හැකිය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ “2021 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම” යනුවෙන් සඳහන් කළ යුතුය.

(2) සෑම අයදුම්කරුවෙකුම ලියාපදිංචිවීමට අපේක්ෂිත එක් එක් අයිතමය සඳහා රු. 500/= ක ආපසු නොගෙවන තැන්පත් මුදලක් ගෙවිය යුතුය. එම මුදල සඳහා “හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්” නමින් ලබා ගත් මුදල් ඇණවුමක් (ගෙවන කාර්යාලය - හම්බන්තොට) හෝ මෙම කාර්යාලයේ සරප්ට මුදල් ගෙවා ලබා ගත් රිසිට්පතක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචිවීමේ ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(3) ලියාපදිංචි වීමට කැමති එක් එක් අයිතමයන් ඉල්ලුම් පත්‍රයේ අංක 05 යටතේ අනු අංක යොදා සඳහන් කළ හැකි අතර එම අයිතමයන් ප්‍රමාණය අනුව එක් එක් අයිතමය සඳහා අදාල මුදල් හි එකතුව එක් මුදල් ඇනවුමක් හෝ රිසිට් පතක් මඟින් මුදල් ගෙවීම සිදු කළ හැකිය.

(4) ඉල්ලුම්කරුවන් ලියාපදිංචි කිරීමේ හෝ නොකිරීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතුය.

(5) සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම් සේවා සැපයුම් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා භාණ්ඩ හා සේවා ලබා ගැනීමට සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට ක්‍රියා කරන අතර ප්‍රමාණවත් ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැතිවිට ඉන් පරිබාහිර ආයතනවලින් මිල ගණන් කැඳවා මිලදී ගැනීමේ සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ අයිතිය හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් සතුය.

(6) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි ඇතුළු වෙනත් ඉදිකිරීම් වැඩ, අලුත්වැඩියා සහ නඩත්තු වැඩ සම්බන්ධ කොන්ත්‍රාත් ලබා ගැනීමට දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කර ඇති අනුමත සමිති සහ සංවිධාන අපේක්ෂා කරන්නේ නම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචිවීම අනිවාර්යය වනු ඇත.

(7) ලංසු කැඳවීමේදී ලංසු ඉදිරිපත් නොකරන, ඇණවුම් සඳහා නියමිත වේලාවට භාණ්ඩ නොසපයන සහ ඉදිරිපත් කළ සාම්පල් අනුව භාණ්ඩ නොසපයන සැපයුම්කරුවන්ගේ නම් දැන්වීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් කපා හැරීමට කටයුතු කරනු ඇත.

(8) දකුණු පළාත තුළ ව්‍යාපාර පවත්වාගෙන යන තැනැත්තන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(9) වැඩි විස්තර මෙම කාර්යාලයේ දුරකථන අංක 0472256139 අමතා ලබා ගත හැකිය.

(10) ලියාපදිංචි කරගනු ලබන සැපයුම් කරුවන්ගේ ලේඛනය 2021.01.15 දිනට පසු www.hambantota.dist.gov.lk වෙබ් පිටුවෙහි Download වරණයට පිවිසී භාගත කරගත හැකිය

ඩබ්ලිව්.එච්. කරුණාරත්න
දිස්ත්‍රික් ලේකම් / දිසාපති,
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය :

### සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

(1) සැපයුම්කරුගේ නම සහ ලිපිනය :
(2) දුරකථන / ෆැක්ස් / ඊ මේල් :
(3) ව්‍යාපාරයේ වෙළඳ නාමය :
(4) ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය :
(ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)
(5) ලියාපදිංචියට අයදුම් කරන අයිතම අංකය සහ කරුණු :
(6) ව්‍යාපාරයේ ස්වභාවය :
(නිෂ්පාදන / ප්‍රධාන වෙළඳ නියොජිත / තොග වෙළඳ නියෝජිත ද යන්න සඳහන් කරන්න)
(7) ණය පදනම මත සැපයීම පිළිබඳ විස්තර :
(උපරිම ණය වටිනාකම සහ කාල සීමාව)
(8) වැට් බදු අංකය :
(9) බැංකුකරුගේ නම සහ ලිපිනය :
(10) මුදල් ඇණවුම් හෝ රිසිට්පත් අංකය සහ ගෙවනු ලබන මුදල : :
(මෙයට යා කර එවා ඇත)

(11). ලබා ඇති ප්‍රමිති සහතික (ISO) වැනි ......................
..................................................................

(12) පෙර වර්ෂ වලදී මෙවැනි සේවා සපයා ඇති ආයතන හෝ මූල්‍ය වත්කම්...........................................
(ඇමුණුම් මගින් ද ඉදිරි පත් කළ හැකිය)

(13) ව්‍යාපාරික ස්ථානයට ලඟාවිය හැකි මාර්ග විස්තරය
...................................................................

(14) වෙනත් වැදගත් විස්තර :
……………………………………………………
………
……………………………………………
……………………………………………
……………...
……………………………………………
……………………………………………
……………...

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවත්, සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වූ පුවත්පත් දැන්වීමේ සඳහන් කොන්දේසිවලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි.

දිනය : .......................... .................................

සැපයුම්කරුගේ/කොන්ත්‍රාත් ගේ
අත්සන
(ව්‍යාපාරිකමුද්‍රාව තබන්න.)